DOI : 10.31357/fhssmst.2016.00681

# ශ්‍රී ලංකාවේ පාරිභෝගිකයාට එරෙහි අපරාධ

# (2010 -2011) වසරවල කොළඹ අධිකරණ කලාපයේ අධිකරණවලට ලැබුණු පැමිණිලි ඇසුරෙන්

13 JAN 2016

කස්තුරිආරච්චිගේ සජීවනී සමන්මල්ලිකා කුමාරි

**1705 SS2010005**

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පශ්චාද් උපාධි පීඨයේ
අපරාධ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා
ඉදිරිපත් කරනු ලබන ස්වාධීන පර්යේෂණ නිබන්ධයයි.

## අපේක්ෂකයාගේ ප්‍රකාශය

මෙම ස්වාධීන පර්යේෂණ නිබන්ධය සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යනාංශයේ අංශ ප්‍රධාන මහාචාර්ය එම්. ඩබ්ලිව්. ජයසුන්දර මහතාගේ සුපරීක්ෂණය යටතේ මා විසින් ස්වාධීනව සම්පාදනය කරන ලද බවත්, මේ පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හො ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලොමාවක් සඳහා ද ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

අත්සන :-

නම :- කස්තුරිආරච්චිගේ සජීවනී සමන්මල්ලිකා කුමාරි

ශිෂ්‍ය අංකය :- 1705 SS2010005

## උපදේශකවරයාගේ ප්‍රකාශය

මා විසින් මෙකී නිබන්ධය සම්පාදනයට අදාළ උපදෙස් සපයන ලද බව සහතික කරමි.

උපදේශකවරයාගේ නම :- මහාචාර්ය එම්. ඩබ්ලිව්. ජයසුන්දර

අත්සන :-

අධ්‍යයනාංශ ප්‍රධාන :- මහාචාර්ය මයුර සමරකෝන්

අත්සන :-

අපරාධ විද්‍යා ශාස්ත්‍රපති උපාධි පර්යේෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා අංක 1705 SS2010005 දරන අපේක්ෂකයා විසින් මාගේ අධීක්ෂණය සහ මග පෙන්වීම යටතේ සම්පාදනය කරනු ලැබූවකි. මෙම පර්යේෂණ කෘතිය ශාස්ත්‍රපති උපාධි පර්යේෂණ ඇගයීම් කටයුතු සඳහා ඉදිරිපත් කිරීමට සුදුසු මට්ටමක පවතින බව මෙයින් සහතික කරමි.

උපදේශකවරයාගේ නම :-මහාචාර්ය එම්. ඩබ්ලිව්. ජයසුන්දර

අත්සන :-

දිනය :- 2016/01/11

පරීක්ෂක මණ්ඩලය විසින් නිර්දේශිත සියලු නිවැරදි කිරීම්, සංශෝධන සහ එකතු කිරීම් උපාධි අපේක්ෂක විසින් අවසාන නිබන්ධය සඳහා ඇතුළත් කර ඇති බව මෙයින් සහතික කරමි.


උපදේශකවරයාගේ නම :-මහාචාර්ය එම්. ඩබ්ලිව්. ජයසුන්දර

අත්සන :-

දිනය :- 2016/01/11

පිදුම

ශ්‍රී ලාංකේය පාරිභෝගික ජනතාවට



## අනුක්‍රමිකාව


01. හැඳින්වීම

1.1 හැඳින්වීම

1.2 අධ්‍යයනයේ අරමුණු

1.3 පර්යේෂණ ගැටළුව

02. පාරිභෝගිකයාට එරෙහි අපරාධ පිළිබඳ ශ්‍රී ලාංකේය නීතිය

2.1 පාරිභෝගිකයාට එරෙහි අපරාධ පිළිබඳ නීතියේ ඓතිහාසික පසුබිම

2.2 ශ්‍රී ලංකාවේ පාරිභෝගිකයාට එරෙහි අපරාධ පිළිබඳ වර්තමානයේ බලපවත්නා නීති

2.2.1 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත

2.2.2 පනත යටතේ වන වැරදි

2.2.3 නඩු කටයුතු සහ දඬුවම්

2.2.4 වරද පිළිබඳ වගකීම

2.3 ආහාර පනත

2.3.1 පනතේ අරමුණ

2.3.2 වැරදි පිළිබඳ අධිකරණ බලය

2.3.3 කාලාවරෝධය

2.3.4 නඩු පැවරිය හැක්කේ කවුරුන් විසින් ද?

2.3.5 පනත යටතේ වන වැරදි

2.3.6 ආහාර පනත යටතේ යම් යම් නියෝග සෑදීම

2.3.7 ආහාර බලධරයා යනු කවරෙක්ද?

2.3.8 බලය ලත් නිලධරයාගේ බලතල

2.3.9 ආහාර බාල කිරීම පිළිබඳ රීති

2.3.10 ආහාර ලේබල් කිරීම, ඇහිරීම, ප්‍රචාරය ආදිය පිළිබඳ රීති

2.3.10.1 බලපත්‍ර ලබා ගැනීම, ප්‍රති ඔක්සිකාරක සහ ආහාර සායම් යෙදීම සහ ආහාරවලට අදාළ ප්‍රතිඥාහාර පිළිබඳ විධිවිධාන

2.3.11 ආහාර පනත ක්‍රියාත්මක කිරීම

2.3.12 ආහාර පනතේ විශේෂතා

2.3.13 තහනම් කරන ලද ද්‍රව්‍ය සම්බන්ධ කාර්ය පටිපාටිය

2.3.14 දඬුවම් සහ නීති කටයුතු

2.3.15 වරද පුද්ගල මණ්ඩලයක් විසින් කරන ලද අවස්ථාවක තත්ත්වය

2.3.16 ආහාර පනත යටතේ වන විත්තිවාචක

2.3.17 පූර්ව නිගමන

2.4 විලවුන් උපකරණ හා ඖෂධ පනත

2.4.1 පනත යටතේ වන වැරදි

2.4.2 රෙගුලාසි සකස් කිරීම

2.4.3 දඬුවම් සහ නීති කටයුතු

2.4.4 කාලාවරෝධය

2.4.5 නඩු පැවරිය හැක්කේ කවුරුන් විසින් ද?

2.4.6 අදාළ වරද සිදු කරන ලද්දේ වෙනත් තැනැත්තකු විසින් බව, චූදිත විසින් ඔප්පු කරනු ලැබූ විට තත්ත්වය

2.4.7 විත්තිවාචක

2.4.8 පූර්ව නිගමන

2.4.9 වරද කරන ලද්දේ පුද්ගල මණ්ඩලයක් විසින් වන විට තත්ත්වය

2.4.10 පාලනය

2.5 මිනුම් ඒකක සහ ප්‍රමිති සේවා පනත

2.5.1 වැරදි සහ දණ්ඩන

2.6 1994 අංක 6 දරන පනතින් සංශෝධිත 1980 අංක 37 දරන පළිබෝධ නාශක පාලන පනත

2.6.1 වැරදි

2.6.2 අටවන වගන්තියේ සඳහන් කරුණු

2.6.3 බලයලත් නිලධාරීන්

2.6.4 අධිකරණ බලය

2.6.5 දඬුවම්

2.6.6 නඩු පැවරීම

2.6.7 වරදකරු පුද්ගල මණ්ඩලයක් වන විට තත්ත්වය

2.6.8 තහනමට ගැනීම

2.7 වෙනත් අණ පනත්

2.7.1 1883 අංක 2 දරන දණ්ඩ නීති සංග්‍රහය ආඥා පනත

03. පාරිභෝගිකයාට එරෙහි අපරාධ පිළිබඳ විදේශීය නීති

3.1 පාරිභෝගිකයාට එරෙහි අපරාධ වැළැක්වීමේ අන්තර් ජාතික ප්‍රතිපාදන

3.1.1 අන්තර්ජාතික ප්‍රතිපාදනවල ඉතිහාසය

3.1.2 පාරිභෝගික ආරක්ෂාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශ

3.2 විවිධ රටවල පාරිභෝගිකයාට එරෙහි අපරාධ

3.2.1 ඉන්දියානු නීතිය

3.2.2 පැමිණිලි ඉදිරිපත්කිරීම

3.2.3 ලබාගතහැකි සහන

3.3 මහා බ්‍රිතාන්‍ය නීතිය

3.3.1 1987 43 පරිච්ඡේදය වන පාරිභෝගික ආරක්ෂණ පනත

3.4 ඔස්ට්‍රේලියානු නීතිය

3.4.1 2012 අංක 21 දරන ඕස්ට්‍රේලියානු පාරිභෝගික නීතිය සහ සාධාරණ වෙළඳ පනත

04. අධ්‍යයන ක්ෂේත්‍රය හැඳින්වීම, දත්ත සකස් කිරීම හා විශ්ලේෂණය

4.1. ක්‍රමවේදය

4.1.1 පර්යේෂණ ක්ෂේත්‍රය සහ පර්යේෂණ ස්වභාවය

4.1.2 නියැදි ක්‍රමය

4.1.3 දත්ත රැස්කිරීම

4.1.4 මූලාශ්‍ර

4.1.5 පර්යේෂණ සීමාවන්

4.1.6 දත්ත විශ්ලේෂණය

05. පාරිභෝගිකයාට එරෙහි අපරාධ පිළිබඳ අපරාධ විද්‍යාත්මක විශ්ලේෂණ

5.1 පාරිභෝගිකයාට එරෙහි අපරාධවලට බලපාන හේතු

5.1.1 අන්තර් ආශ්‍රය පිළිබඳ සිද්ධාන්තය

5.1.2 සමාජ ආකෘතිය හා අනෝමීය තත්ත්වය පිළිබඳ රොබර්ට් කේ. මර්ටන්ගේ විග්‍රහය

5.2 පාරිභෝගිකයාට එරෙහි අපරාධ වල ප්‍රතිඵල සහ සමාජ බලපෑම

06. නිගමනය හා යෝජනා

6.1නිගමන

6.2 යෝජනා

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

ඇමුණුම්

## වගු නාමාවලිය

| | | |
|---|---|---|
| | | පිටු අංකය |
| 1 වගුව | - පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට ලැබුණු පැමිණිලි (2005-2011) | 8-9 |
| 2 වගුව | - පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් කරන ලද වැටලීම් (2005-2011) | 9-10 |
| 3 වගුව | - පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් අය කරන ලද දඩ මුදල් | 12-13 |
| 4 වගුව | - 2010 වසරේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට ලැබුණු පැමිණිලි සම්බන්ධයෙන් ගෙන ඇති පියවර | 117 |
| 5 වගුව | - 2011 වසරේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිට ලැබුණු පැමිණිලි සම්බන්ධයෙන් ගෙන ඇති පියවර | 118 |
| 6 වගුව | - 2010 සහ 2011 වසරවල කරන ලද පැමිණිලිවලට අදාළ භාණ්ඩ හා සේවා විශේෂ | xiv-xxii |
| 7 වගුව | - පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය ස්වකීය වැටලීම් සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි පියවර සහ ඒවායේ ප්‍රතිපල | xxiii-xxvi |
| 8 වගුව | - පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත කඩ කිරීම (වැටලීම් ඇසුරෙන්) විශ්ලේෂණය | 138 |
| 9 වගුව | - ආහාරවලින් සිදුවන භෞතික උපද්‍රව | 158-159 |

## ප්‍රස්ථාර නාමාවලිය


පිටු අංකය

ප්‍රස්ථාර අංක 1 - 2010 වසරේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට ලැබුණු පැමිණිලි සම්බන්ධයෙන් ගෙන ඇති පියවර 117

ප්‍රස්ථාර අංක 2 - 2011 වසරේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිට ලැබුණු පැමිණිලි සම්බන්ධයෙන් ගෙන ඇති පියවර 118

ප්‍රස්ථාර අංක 3 - පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත කඩ කිරීම (වැටලීම් ඇසුරෙන්) විශ්ලේෂණය 139

# ස්තුතිය

අපරාධ විද්‍යාව පිළිබඳ උපදිෂ්ඨ ශාස්ත්‍රපති උපාධිය සඳහා වන ස්වාධීන පර්යේෂණ නිබන්ධය සඳහා වූ මෙම පර්යේෂණයේ දී උපදේශක ලෙස කටයුතු කරමින් මා හට අවශ්‍ය සියලු උපදෙස් ලබා දෙමින් සිය කාර්ය බහුල රාජකාරී කටයුතු මධ්‍යයේ වුවද මෙම කටයුත්ත නිරන්තර සමීක්ෂණයට ලක් කළ මහාචාර්ය එම්. ඩබ්ලිව්. ජයසුන්දර මහතාට ප්‍රථමයෙන්ම මාගේ භක්ති පූර්වක ස්තුතිය පිරිනමමි. එමෙන්ම මෙම පර්යේෂණයේ දුර්වල තැන් නිවැරදි කර ගැනීමට මග පෙන්වූ මහාචාර්ය දයා අමරසේකර මහතාට මාගේ භක්ති ප්‍රණාමය පිරිනමන අතර, මෙම පර්යේෂණය සඳහා අවශ්‍ය දත්තයන් ලබා ගැනීමට මට සහාය වූ සියලුම මහේස්ත්‍රාත්වරුන් ට ද, අධ්‍යක්ෂ ජනරාල් ජේ. එම්. ඒ. ඩග්ලස් මහතා ට ද, අනුකූලවීම් හා බලගැන්වීම් අංශයේ අධ්‍යක්ෂිකා නීතිඥ දීප්ති තිසේරා මහත්මියට සහ පාරිභෝගික කටයුතු හා තොරතුරු අංශයේ අධ්‍යක්ෂිකා චන්ද්‍රිකා තිලකරත්න මහත්මියට ද එම අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ අසේල බණ්ඩාර, සහකාර අධ්‍යක්ෂ ප්‍රියන්ත විජේසිංහ යන මහත්වරුන් ට ද. අධිකාරියේ සියලුම නීති නිලධාරිනියන්ට සහ විමර්ශන නිලධාරීන් සහ නිලධාරිනියන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයට ද, මාගේ ගෞරවනීය ස්තුතිය පිරිනමමි.

ක්‍රි.ව. 2014 ජුනි මස 22 වන දින
අතුරුගිරිය,
මොරටුවහේන පාරේ
අංක 239/15 දරන නිවසේ දීය,

# නිබන්ධ සාරාංශය

මෙම පර්යේෂණයේ අරමුණු වූයේ

1. දැනට ශ්‍රී ලංකාවේ බහුල වශයෙන් වාර්තාවන පාරිභෝගිකයාට එරෙහි අපරාධ සහ ඒවාට හේතු හඳුනා ගැනීම.

2. පාරිභෝගිකයාට එරෙහි අපරාධ කරණ කොට ගෙන සමාජයට ඇතිවන බලපෑම හඳුනා ගැනීම.

3. පාරිභෝගිකයාට එරෙහි අපරාධ වලට අදාළ ශ්‍රී ලාංකේය අණ පනත් විග්‍රහ කිරීම. සහ

4. පාරිභෝගිකයාට එරෙහි අපරාධ වැළැක්වීම සඳහා ගත යුතු ක්‍රියා මාර්ග සහ ක්‍රමෝපායන් හඳුනා ගැනීම යන ඒවා වන අතර එම අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී පාරිභෝගිකයාට එරෙහි අපරාධ වලට අදාළ ශ්‍රී ලාංකේය අණ පනත් ලෙස පහත සඳහන් අණපනත් විග්‍රහ කර ඇත.

1. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත

2. ආහාර පනත

3. විලවුන් උපකරණ හා ඖෂධ පනත

4. මිනුම් උපකරණ හා ප්‍රමිති සේවා පනත

5. පළිබෝධ නාශක පාලන පනත

6. දණ්ඩ නීති සංග්‍රහය ආඥා පනත

එමෙන්ම අදාළ අපාරාධ විශේෂයට බලපාන හේතු සහ ඒවා වැළැක්වීමට ගත යුතු පියවර ද, එම අපරාධ කරණකොටගෙන සමාජයට ඇතිවන බලපෑම ද විග්‍රහ කර ඇත. මෙහිදී විශේෂයෙන් අනෝමීය සිද්ධාන්තය හා අන්තර් ආශ්‍රය පිළිබඳ සිද්ධාන්තය මෙම අපරාධ විශේෂය හා සම්බන්ධ වන අන්දම මා විසින් දක්වා ඇත.

## 1.1 හැඳින්වීම

වෙළෙඳුන් විසින් පාරිභෝගිකයන් වංචා කිරීම ඈත අතීතයේ පටන්ම සමාජය තුළ දැකගත හැකි වූ සංසිද්ධියක් බවට සාක්ෂි පැරණි සාහිත්‍ය පොත පත පරිශීලනය කිරීමේදී පවා අපට දක්නට ලැබේ. ත්‍රිපිටකයෙහි සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට අයත් දහවන ග්‍රන්ථය වන ජාතක පාළියට බුද්ධඝෝෂ හිමියන් විසින් පස් වැනි සියවසේදී ලියන ලදැයි සැළකෙන ජාතකට්ඨ කතාවෙහි එන තුන් වන ජාතක කතාව සේරි වානිජ ජාතකයයි. එහි මහලු ස්ත්‍රියක සහ කුඩා දැරියක වංචා කිරීමට සැරසුණු වෙළෙන්දකු ගැන කතා පුවතක් ඇතුළත් වේ.

වෙළෙන්දා තැටිය අතින් ගෙන රන් බඳුනක් යැයි පෙරළා තැටියේ අඩියෙහි ඉඳිකටුවෙන් ඉරක් ඇඳ රන් බඳුනක් බව දැන මොවුන්ට කිසිවක් නොදීම රන් බඳුන ගෙන යන්නෙමි යි සිතා මෙහි කිසිම වටිනා කමක් නැත. මුදලින් අඩ මසක් වත් නොවටීයි කියා බඳුන බිම දමා හුනස්නෙන් නැගී ගියේය. (චන්දකිත්ති, 2007: 129)

එහිම පස්වන ජාතක කතාව වන තණ්ඩුලනාළි ජාතකය භාණ්ඩ තක්සේරු කිරීම හොරට සිදු කළ තක්සේරුකරුවකු සම්බන්ධ කතාවකි. මෙම තක්සේරු කරුවා විසින් තනතුරු ලෝභයෙන් පන්සියයක් අසුන් හාල් නැළියකට මිල කොට, ඉන් අනතුරුව අස් වෙළෙන්දා ගෙන් අල්ලස් ලබාගෙන, හාල් නැළිය ඇතුළු සහ පිටි නුවර සහිත මුලු බරණැස් නුවර තරම් වටිනා බවට මිල කරන ලද බව එහි සඳහන්වේ.

අස් වෙළෙන්දා රජුන් වැඳ දේවයිනි, පන්සියයක් අසුන් එක් සහල් නැළියක් අගනා බව දනිමි. ඒ සහල් නැළිය කොතෙක් අගී දැයි තක්සේරුකරුගෙන් අසනු මැනව. රජතුමා ඒ පුවත නොදන්නේ එම්බල තක්සේරු කරුව, අසුන් පන්සියය කොතෙක් අගීද? දේවයිනි, සහල් නැළියකි. එම්බා තක්සේරුකරුව, අසුන් පන්සියයක මිල සහල් නැළියක් වේවා, ඒ සහල් නැළියේ මිල කොතෙක්දැයි කියව. ඒ මෝඩ පුරුෂයා ඇතුළත පිටත සහිත බරණැස් පුරවරය සහල් නැළියක් වටීයැයි කීවේය. (චන්දකිත්ති, 2007: 144)

ඛුද්දක නිකායටම අයත් හත් වන ග්‍රන්ථය වන **ප්‍රේත වස්තුවෙහි එන භෝග සංහරණ ප්‍රේත වස්තුව** නමැති කතාවෙහි සඳහන් ප්‍රේතියන් වූකලී හොර මැනීම් කළ ස්ත්‍රීන්ය.

සනරාමර ලෝක ශිවඞ්කර භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වේළුවනාරාමයෙහි වැඩ වදාරන කල්හී රජගහ නුවර වැසි ස්ත්‍රීහු සතර දෙනෙක් වනාහී හොර මැනීම් ආදී වශයෙන් ගිතෙල් මීතෙල් ධාන්‍යාදිය වෙළඳාම් කොට නුනුවනින් වස්තු රැස් කොට ජීවත් වෙමින් සිට මැරී ගොස් නුවරින් පිට දිය අගලක් මතුපිට ප්‍රේතියෝව උපන්නාහුය. (සිරි රාහුල, 1997: 421-422)

කෙසේ වුවද වානිජ ලෝකයට පොදුවූ මෙම වංචා කිරීම් හැකි තාක් දුරට පාලනය කිරීම අරමුණු කොට ගෙන පාරිභෝගික ආරක්ෂණ නීති නමින් හැඳින්වෙන නීති සමුදායක් මේ වන විට ලෝකයේ සෑම රටකම පාහේ ව්‍යවස්ථාපිතව පවතී. නන්දසේන රත්නපාල මහතා සිය **අපරාධ විද්‍යාවේ මූලධර්ම 1** නමැති කෘතියේ දී මෙම අපරාධ අතරින් සමහරක් සුදු කරපටි අපරාධ ගනයේ ලා වර්ග කර ඇත. ඔහු විසින් මෙම අපරාධ විශේෂයට පාරිභෝගිකයා රැවටීම (Consumer Fraud) යන නාමය ලබාදී තිබේ. පාරිභෝගිකයා රැවටීම, බර අඩුව විකිණීම, නොවටිනා දේ වටිනා දේ ලෙස දැක්වීම, නැති ගුණ වර්ණනා කොට විකිණීම, පාරිභෝගිකයා වෙනත් ආකාරයෙන් රැවටීම මීට අයත් වෙයි. වැඩියෙන්ම මේ රැවටීමට අසුවන්නේ දුප්පත් පාරිභෝගිකයාය. ලේසියෙන් ණය ලබාදීම ද මීට එකතු කළ හැකිය. (රත්නපාල, 2003: 177)

ෆ්‍රැන්ක් එෆ්. හේගන් ද සිය Crime Types and Criminals නමැති කෘතියෙහි දී මෙම අපරාධ අතරින් සමහරක් සුදු කරපටි අපරාධ ගනයේ ලා වර්ග කර ඇත. ඔහු වෙළෙඳුන් විසින් පාරිභෝගිකයන්ට එරෙහිව කරන අපරාධ, රක්ෂණ වංචා, අනාරක්ෂිත භාණ්ඩ නිෂ්පාදනය, කූට වෙළඳ ප්‍රචාරණ, සෞඛ්‍ය ආරක්ෂාව කඩකෙරෙන නිෂ්පාදන සිදු කිරීම, පේටන්ට් අයිතිය උල්ලංඝණය කිරීම සහ වෙළෙඳුන් අතර පවත්නා අසාධාරණ තරගය මෙම ගනයේ වඩාත් ප්‍රචලිත අපරාධ ලෙස පෙන්වා දෙයි. (Hegan, 2010: 208)

පාරිභෝගික ගනු දෙනු සම්බන්ධව පැවති මුල් කාලීන පිළිගත් නීතිය කේවියට් එම්ප්ටෝර් නමැති ප්‍රතිපත්තිය මත පදනම් විය. එහි අර්ථය වූයේ ගැනුම්කරු පරිස්සම් විය යුතුය යන්නයි.